# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## එකතු කළ අගය මත බදු (සංශෝධන)

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්
2018 ජූලි මස 17 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2018 ජුනි මස 29 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

**[256 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල :** රු. 18.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

*2 වන වගන්තිය* : මේ වගන්තිය මඟින් (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු සංශෝධන පනතේ 22 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ආනයනය මත පදනම් වූ සමාගම් විසින් දේශීයව විකුණනු ලබන ඇතැම් ඇගළුම් සඳහා ගෙවීමට නියමිත බදු මුදල අඩු කිරීම වේ.

*3 වන වගන්තිය* : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 25අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ 2018 අප්‍රේල් මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි මූල්‍ය සේවා සපයන නිශ්චිත ආයතනයක් වශයෙන් මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය ඇතුළත් කිරීම වේ.

*4 වන වගන්තිය* : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ 25ඇ වගන්තියේ (3) වන උපවගන්තියේ (ඉ) සහ (ඊ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති පරිදි, ගෙවිය යුතු බදු මුදල සඳහා වන බදු කාලසීමාව සීමා කිරීම වේ.

*5 වන වගන්තිය* : මේ වගන්තිය මඟින් සංචාරකයන් විසින් ගෙවන ලද බදු මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලැස්වීම සඳහා ප්‍රධාන ප්‍රඥප්තියට 58අ වන නව වගන්තිය ඇතුළත් කරනු ලැබේ.

*6 වන වගන්තිය* : මේ වගන්තිය මඟින් පෙර දී ප්‍රදානය කළ ඇතැම් බදු නිදහස් කිරීම් ඉවත්කොට 2017 අයවැය යෝජනා බලාත්මක කිරීම සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස සංශෝධනය කරනු ලැබේ.

# එකතු කළ අගය මත බදු (සංශෝධන)

එල්.ඩී.—ඕ. 70/2016

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2018 අංක     දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ලුහුඬු නාමය.*

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 22 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ පළමුවන අතුරුවිධානයේ (අ) ඡේදයේ "2016 නොවැම්බර් මස 1 වන දිනට පෙරාතුව" යන වචන සහ ඉලක්කම්වලින් ආරම්භව "රුපියල් හැත්තෑ පහක් විය යුතු ය;" යන්නෙන් අවසන් වන වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

*2002 අංක 14 දරන පනතේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.*

"ඇඟළුම් සඳහා පහත අනුප්‍රමාණයන්ට අනුව විය යුතු ය:—

(i) 2016 නොවැම්බර් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා එවැනි එක් එක් ඇඟළුමක් සඳහා රුපියල් විසි පහයි;

(ii) 2016 නොවැම්බර් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන, එහෙත් මේ (සංශෝධන) පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින හෝ එදිනට පසු ඉක්බිතිව ම වන දිනෙන් අවසන් වන යම් කාලසීමාවක් සඳහා එවැනි එක් එක් ඇඟළුමක් සඳහා රුපියල් හැත්තෑ පහයි;

(iii) මේ (සංශෝධන) පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින හෝ එදිනට පසු ආරම්භ වන, යම් කාලසීමාවක් සඳහා රේගු කාර්යය සඳහා වන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගෙන ඇති කාන්තා යට කලිසම්, මේස් සහ බොක්සර් කොට කලිසම් හැර එවැනි එක් එක් ඇඟළුමක් සඳහා රුපියල් හැත්තෑ පහයි;

(iv) මේ (සංශෝධන) පනතෙ ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනෙන් ආරම්භ වන, යම් කාලසීමාවක් සඳහා රේගු කාර්යය සඳහා වන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගෙන ඇති කාන්තා යට කලිසම්, මේස් සහ බොක්සර් කොට කලිසම් කැලි හයක් සඳහා රුපියල් හැත්තෑ පහයි.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 25අ වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 25අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ (iv) වන ඡේදයේ “(422 වන අධිකාරය වූ) මුදල් පනත මඟින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව විසින්;” යන වචන සහ ඉලක්කම් වෙනුවට “(2018 අප්‍රේල් මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි) (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත මඟින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හෝ එකී පනත යටතේ සාදන ලද නියෝගය මඟින් පිහිටුවන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය විසින්;” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීම මඟින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වන වගන්තියේ (3) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම උපවගන්තියේ (ඉ) ඡේදයේ “(ඉ) 2015 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන එහෙත් 2016 මැයි මස 2 වන දිනට පෙරාතුව” යන වචන සහ ඉලක්කම් වෙනුවට “(ඉ) 2015 ජනවාරි මස 1 වන දිනෙන් ආරම්භ වන, එහෙත් 2016 මැයි මස 2 වන දිනට පෙරාතුව සහ, 2016 ජූලි මස 12 වන දිනෙන් ආරම්භව, එහෙත් 2016 නොවැම්බර් මස 1 වන දිනට පෙරාතුව” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම උපවගන්තියේ (ඊ) ඡේදයේ “(ඊ) 2016 මැයි මස 2 වන දිනෙන් ආරම්භ වන කාලසීමාව සඳහා” යන වචන සහ ඉලක්කම් වෙනුවට “(ඊ) 2016 මැයි මස 2 වන දිනෙන් ආරම්භ වන, එහෙත් 2016 ජූලි මස 12 වන දිනට පෙරාතුව සහ, 2016 නොවැම්බර් මස 1 වන දිනෙන් ආරම්භ වන කාලසීමාව සඳහා” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 58අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**5.** මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තියට ඉක්බිතිව ම ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 58අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"සංචාරකයන්ට බදු මුදල් ආපසු ගෙවීම.

58අ. (1) 2018 ජූලි මස 1 වන දිනෙන් ආරම්භ වන කාලසීමාව සඳහා යම් සංචාරකයකු විසින්, නියමිත ආකෘතිය මත වූ ලියවිල්ලකින් වූ හිමිකම්පෑමක් මගින්-

(අ) එම සංචාරකයා විසින් බලයලත් සිල්ලර වෙළෙන්දකුගෙන් ශ්‍රී ලංකාවේ දී නියම කරනු ලබන යම් නිශ්චිත භාණ්ඩ මිල දී ගෙන තිබෙන බව;

(ආ) එම භාණ්ඩවල වටිනාකම නියම කරනු ලබන අවම වටිනාකම ඉක්මවන බව; සහ

(ඇ) එම බලයලත් සිල්ලර වෙළෙන්දා විසින් සංචාරකයා වෙත නිකුත් කරන ලද බදු ඉන්වොයිසිය ප්‍රකාරව එම සංචාරකයා විසින් එම මිල දී ගැනීම් මත බද්ද ගෙවා තිබෙන බව,

එම සංචාරකයා විසින්, දේශීය ආදයම් කොමසාරිස්-ජනරාල්වරයා හෝ ඔහු විසින් තත් කාර්යය සඳහා බලය පවරන ලද යම් තැනැත්තකු සෑහීමට පත්වන පරිදි ඔප්පු කර ඇති අවස්ථාවක, එම සංචාරකයා ශ්‍රී ලංකාවෙන් බැහැර වන ස්ථානයේ දී අදාළ භාණ්ඩ පරීක්ෂා කිරීම පිණිස ඒ සඳහා බලයලත් තැනැත්තා වෙත ඉදිරිපත් කරන්නේ නම් සහ ඒ භාණ්ඩ මිල දී ගත් දින සිට මාස දෙකක් ඇතුළත ශ්‍රී ලංකාවෙන් බැහැරට ගෙන යනු ලබන්නේ නම්, දේශීය ආදයම් කොමසාරිස්-ජනරාල්වරයා හෝ බලයලත් තැනැත්තා විසින් (අ), (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති කරුණු පිළිබඳව සෑහීමට පත්වීමෙන් පසුව, එම භාණ්ඩ ශ්‍රී ලංකාවෙන් ඉවත් කරගෙන යන අවස්ථාවේ දී එක්සත් ජනපද ඩොලර් සියයක් සඳහා වන රුපියල් අගය පදනම් කර ගෙන ගණනය කරනු ලබන වැඩිපුර ගෙවා ඇති බදු මුදල් ප්‍රමාණය එම

සංචාරකයාට විදේශ ව්‍යවහාර මුදලින් ආපසු ගෙවීම හෝ ආපසු ගෙවීමට අවශ්‍ය කටයුතු සැලැස්විය හැකි ය.

(2) ස්වකීය ලියාපදිංචිය සිදු කර ඇත්තේ යම් කොන්දේසිවලට යටත්ව ද, ඒ යම් කොන්දේසියක් උල්ලංඝනය කරන බලයලත් සිල්ලර වෙළෙන්දකු වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් අනතුරුව වරදකරු කරනු ලැබීමෙන් පසු, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට සහ ඔහුගේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබීමට යටත් විය යුතු ය.

(3) 20 වන වගන්තියේ (1) වන උපවගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද, යම් බලයලත් සිල්ලර වෙළෙන්දකු විසින් ඒ නිශ්චිත භාණ්ඩ මිල දී ගත් යම් සංචාරකයකුට එම නිශ්චිත භාණ්ඩ සපයන අවස්ථාවේ දී, බදු ඉන්වොයිසියක් නිකුත් කළ හැකි ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා-

(අ) "බලයලත් සිල්ලර වෙළෙන්ද" යන්නෙන්, මේ වගන්තිය යටතේ බලයලත් සිල්ලර වෙළෙන්දකු ලෙස ලියාපදිංචිවීම සඳහා දේශීය ආදායම් කොමසාරිස්-ජනරාල්වරයා හෝ ඔහු විසින් තත් කාර්යය සඳහා බලය පවරා ඇති යම් තැනැත්තකු වෙත ඉල්ලුම් කර ඇති සිල්ලර වෙළෙන්දකු අදහස් වේ;

(ආ) "සංචාරකයා" යන්නෙන්, සංචාරක වීසා මත දින තිහකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවේ නැවතී සිටින යම් විදේශිකයකු අදහස් වේ.".

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) ඒ කොටසේ (අ) ඡේදයේ-

(අ) (i) වන අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

"(i) 2016 නොවැම්බර් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි තිරිඟු, තිරිඟු පිටි හෝ ළදරු කිරි පිටි";

(ආ) (iv) වන අයිතමයේ "ගුවන්යානා, හෙලිකොප්ටර්" යන වචන වෙනුවට "ගුවන්යානා හෝ හෙලිකොප්ටර් [මේ (සංශෝධන) පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනට පෙරාතුව]" යන වචන ආදේශ කිරීම මඟින්;

(ඇ) (v) වන අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

"(v) 2016 නොවැම්බර් මස 11 වන දිනට පෙරාතුව වන යම් කාලසීමාවක් සඳහා (චෙක්පොත්, වාර ප්‍රකාශන, සඟරා, පුවත්පත්, දිනපොත්, ලෙජර් පොත් සහ අභ්‍යාස පොත් හැර) පොත්පත්;

2016 නොවැම්බර් මස 11 වන දින හෝ එදිනට පසුව වන යම් කාලසීමාවක් සඳහා රේගු කාර්යය සඳහා වන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගෙන ඇති (පුවත්පත් හැර) පොත්පත්, සඟරා, ජර්නල් හෝ වාර ප්‍රකාශන; සහ

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ හෝ යම් පළාත් සභාවක පාවිච්චි නොකළ තැපැල් මුද්දර හා ආදායම් මුද්දර;";

(ඇ) එම ඡේදයේ (xxii) වන අයිතමයේ -

(i) (i) වන අනු අයිතමයේ "අච් කණ්ණාඩි" යන වචන වෙනුවට "අච් කණ්ණාඩි [මේ (සංශෝධන) පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනට පෙරාතුව]," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ii) (iv) වන අනු අයිතමයේ "දැව (ඉරන ලද)" යන වචන වෙනුවට "දැව (ඉරන ලද) [මේ (සංශෝධන) පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනට පෙරාතුව]," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(iii) (v) වන අනු අයිතමයේ "පරිභෝජනය සඳහා වන රෙදිපිළි;" යන වචන සහ ඉලක්කම් වෙනුවට "පරිභෝජනය සඳහා වන රෙදිපිළි [මේ (සංශෝධන) පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනට පෙරාතුව];" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(iv) (vii) වන අනු අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

"(vii) 2017 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වන යම් කාලසීමාවක් සඳහා බලශක්ති පිරිමැසුම් විදුලි බුබුලු සහ බලශක්ති පිරිමැසුම් විදුලි බුබුලු නිෂ්පාදනය කිරීම සඳහා අමුද්‍රව්‍ය;";

(ඉ) (xxvi) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

"(xxvii) 2016 නොවැම්බර් මස 11 වන දින සිට බලාත්මක වන පරිදි රේගු කාර්යය සඳහා වන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගෙන ඇති පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සඳහා වන පිරියත, යන්ත්‍රසූත්‍ර සහ උපාංග;

(xxviii) 2016 නොවැම්බර් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි රේගු කාර්යය සඳහා වන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගෙන ඇති විදුලි උපකරණ;

(xxix) 2016 නොවැම්බර් මස 11 වන දින සිට බලාත්මක වන පරිදි රේගු කාර්යය සඳහා වන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගෙන ඇති වෛද්‍ය යන්ත්‍රසූත්‍ර හෝ වෛද්‍ය උපාංග;

(xxx) 2017 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි රේගු කාර්යය සඳහා වන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගෙන ඇති උණුසුම් වායු බැලුන.";

(2) (අ) ඒ කොටසේ (xi) වන අයිතමයේ (ආ) ඡේදයේ-

(i) (ආ) වන අනු අයිතමයේ, "2016 නොවැම්බර් මස 1 වන දින හෝ එදිනට පසු යම් තැනැත්තකු විසින්" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "2016 නොවැම්බර් මස 1 වන දින හෝ එදිනට පසු, එහෙත් මේ (සංශෝධන) පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව යම් තැනැත්තකු විසින්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ii) (ආ) අනු අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:—

"(ඇ) එම සැපයුම් 2019 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව සිදු වී ඇත්නම්, එම සැපයුම්-

(i) යම් සහාධිපත්‍ය නිවාස ඒකක විකිණීමක් හා සම්බන්ධ නොවන සැපයුම් වන; හෝ

(ii) සහාධිපත්‍ය නිවාස ව්‍යාපෘතියක නිවාස ඒකක සැපයුමක් වන්නා වූ

එවැනි ඒකකයක සහ එම ව්‍යාපෘතියේ එක් එක් ඒකකවල උපරිම මිල හෝ වෙළෙඳපොළ වටිනාමක යන දෙකෙන් වඩා වැඩිවන වටිනාකම රුපියල් මිලියන පහළොවක් නොඉක්මවන්නා වූ සැපයුම්.";

(ආ) (xxx) වන අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

"(xxx) 2016 නොවැම්බර් මස 1 වන දිනට පෙරාතුව සහ 2016 නොවැම්බර් මස 22 වන දින සිට වන යම් කාලසීමාවක් සඳහා දේශීයව නිෂ්පාදිත ස්වර්ණාභරණ;";

(ඇ) (L) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:—

"(Li) වෘද්ධ සේවාවන් සහ ළමා සත්කාරක සේවාවන්;

(Lii) "බාහිර පිවිසුම් ක්‍රියාකරුවන්" විසින් දේශීය විදුලි සංදේශ ක්‍රියාකරුවන් වෙත සපයනු ලබන අභ්‍යන්තර විදුලි සංදේශ සේවාවන්.".

(3) ඒ කොටසේ (ඇ) ඡේදයේ-

(අ) (xx) වන අයිතමයේ "ආනයනය කිරීම් (2007.07.17 දින සිට බලාත්මක වන පරිදි)" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආනයනය කිරීම (2007.07.17 දින සිට බලාත්මක වන පරිදි, එහෙත් මේ (සංශෝධන) පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව);" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) (xxviii) වන අයිතමයේ "සිනමාශාලා කැමරා සහ ප්‍රොජෙක්ටර් කොටස් සහ අමතර කොටස්," යන වචන සහ ඉලක්කම් වෙනුවට "මේ (සංශෝධන) පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව, සිනමාශාලා කැමරා, ප්‍රොජෙක්ටර් කොටස් සහ අමතර උපාංග," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඇ) (xxix) වන අයිතමයේ, "(2011 ජනවාරි මස 1 වන දින සිට බලපවත්වන පරිදි)" යන වචන සහ ඉලක්කම් වෙනුවට (2011 ජනවාරි මස 1 වන දින සිට බලපවත්වන පරිදි, එහෙත් මේ (සංශෝධන) පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනට පෙරාතුව)" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඈ) (xxxiii) වන අයිතමයේ, "යම් වර්ගයක කෘෂිකාර්මික නිෂ්පාදන හෝ පැල වගාකරුවකු" යන වචන වෙනුවට "මේ (සංශෝධන) පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනට පෙරාතුව, යම් වර්ගයක කෘෂිකාර්මික නිෂ්පාදන හෝ පැල වගාකරුවකු" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඉ) (xxxvi) වන අයිතමයේ "රෙදිපිළි." යන වචන වෙනුවට "රෙදිපිළි [මේ (සංශෝධන) පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනට පෙරාතුව]." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

7. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.